# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2466/40 – 2025 දෙසැම්බර් මස 12 වැනි සිකුරාදා – 2025.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2023/101.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.27 දිනැති හා අංක 2399/23 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.07.29 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1.කැළණිය, වරාගොඩ, ජයතිලක මාවත, අංක 181/4 බී හි පදිංචි ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිනී මිය 2. යක්කල, අළුත්ගම බෝගමුව, ගල්ගෙඩියන පාර, අංක 206 එෆ් හි පදිංචි ආචාර්ය පී.සී.ගිරිහාගම මයා 3. පන්නිපිටිය, මාකුඹුර, සිරිලක් මාවත, අංක 276/15 හි පදිංචි එන්. බී. එස්. දර්ශනී මිය 4. මහරගම, නාවින්න, පරණ පාර, අංක 89/12 ඒ හි පදිංචි හේමන්තා බටගොඩ මිය 5.පස්යාල, වෙදෙගම, 177/ ඒ හි පදිංචි කෞමලී දිසානායක මිය 6. පුස්සැල්ලාව, උඩකුඹුර, 230 හි පදිංචි නිලන්ත වීරක්කොඩි මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 07, විජේරාම මාවත, අංක 114/9 හි පදිංචි ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 70/2024 හා 2025.10.01 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 නොවැම්බර් මස 17 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව

නඩු අංකය - A/70/2024
යොමු අංකය - IR/COM/01/2023/101.

01. ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණි මිය,
181/4 බී. ජයතිලක මාවත, වරාගොඩ,
කැළණිය.

02. ආචාර්ය පී.සී. ගිරිහාගම මයා,
206.එෆ්, ගල්ගේඩියන පාර, අළුත්ගම,
බෝගමුව, යක්කල.

03. එන්. බී. එස්.දර්ශනී මිය,
276/15, සිරිලක් මාවත,
මාකුඹුර, පන්නිපිටිය.

04. හේමන්තා බටගොඩ මිය,
89/12 ඒ, පරණ පාර, නාවින්න මහරගම.

05. කෞමලී දිසානායක මිය,
177/ඒ, වෙදෙගම, පස්යාල.

06. නිලන්ත වීරක්කොඩි මයා,
230, උඩකුඹුර, පුස්සැල්ලාව.

*පළමු පාර්ශ්වය*

*සහ*

ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති
සභාව, අංක 114/9,
විජේරාම මාවත, කොළඹ 07.

*දෙවන පාර්ශ්වය*

කම්කරු අමාත්‍ය මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු අමාත්‍යවරයා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමගින් කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ජේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2024.12.09 වැනි දින බේරුම්කරු වශයෙන් එම්.එම්.අයි. ආර්. ඒ.ජයතිලක වන මා පත් කර ඇත.

මෙම කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කර ඇත.

“ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සේවය කරන පහත නම් සඳහන් නිලධාරීන්ගේ පත්වීම් ලිපි ප්‍රකාරව,

01. 2021 වසර සිට ලබා නොගත් වෛද්‍ය නිවාඩු නොගෙවීම් සහ
02. 2022 වසර සිට වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය නොකිරීම

මඟින් ඔවුන්ට අසාධාරණයක් සිදු වී ඇත් ද යන්නත් එසේ අසාධාරණයක් සිදු වී ඇත්නම් ඔවුන්ට ලැබිය යුතු හිමිකම් කවරේද යන්නත් පිළිබඳව වේ. ”

| | |
|---|---|
| 01. ආචාර්ය එස්. එම්. සී. පී. පද්මිණි මිය | 04. හේමන්තා බටගොඩ මිය |
| 02. ආචාර්ය පී.සී.ගිරිහාගම මයා | 05. කෞමලී දිසානායක මිය |
| 03. එන්.බී. එස්. දර්ශනී මිය | 06. නිලන්ත වීරක්කොඩි මයා |

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 39 වන වගන්තිය අනුව අමාත්‍යවරයාට පැවරී ඇති බලතල ප්‍රකාරව ඔහු විසින් පනවන ලද නියෝග අංක 21(1) හා 21(2) මඟින් දක්වා ඇති පරිදි ආරාවුලට විෂය වී ඇති සම්පූර්ණ කරුණු සම්බන්ධයෙන් වූ විස්තර ප්‍රකාශයක් දෙපාර්ශ්වයෙන්ම ලබා ගතිමි. අනතුරුව ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය වෙතින් ලද විස්තර ප්‍රකාශයට පිළිතුරු ලෙස වූ ප්‍රති උත්තර ප්‍රකාශයක් දෙපාර්ශ්වය වෙතින් වෙන වෙනම ලබා ගතිමි.

2025.01.15 වැනි දින දෙපාර්ශ්වය කැඳවා ආරාවුල නිරවුල් කර ගැනීම සම්බන්ධයෙන් යම් එකඟතාවයක් ඇති කර ගෙන ආරාවුල සමථයකට පත් කර ගැනීම කෙරෙහි දෙපාර්ශ්වයේ එකඟතාවයක් ඇත් දැයි පරීක්ෂා කර බැලුවෙමි. එවැනි එකඟතාවයක් පෙන්නුම් නොකරන ලද අතර බේරුම්කරණය සඳහා වූ සාක්ෂි විභාගය සඳහා ඉදිරි පියවර ගැනීමට තීරණය කළෙමි. ඒ අනුව මීලඟ සාක්ෂි විභාගය 2025.02.03 වැනි දිනට නියම කළෙමි.

සාක්ෂි විභාග කිරීම 2025.01.15 වැනි දින සිට 2025.07.11 දින දක්වා පවත්වන ලද අතර අවසාන ලිඛිත දේශන 2025.08.13 දිනට ලබා දෙන ලෙස දෙපාර්ශ්වයට නියම කළෙමි.

කාර්මික ආරාවුල් පනතේ නියෝග අංක 21(1) හා 21(2) අනුව ආරාවුල ඇතිවීමට හේතු වූ කාරණා පිළිබඳව දෙපාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රකාශ හා ප්‍රතිඋත්තර ප්‍රකාශයන්ද ඉදිරිපත් වූ වාචික සාක්ෂි ද ලේඛනමය සාක්ෂි ද විශ්ලේෂණය කර සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් ලබා දීමට කටයුතු කළෙමි.

**සාක්ෂි විශ්ලේශනය**

කෘෂිකාර්මික පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව (CARP) යනු කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ව්‍යාවස්ථාපිත ආයතනයකි. 1987 අංක 47 දරන පාර්ලිමේන්තුවේ සම්මත පනතකින් ස්ථාපිත කර ඇත. මෙම පනතේ ප්‍රතිපාදන අනුව ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභා අරමුදල නමින් අරමුදලක් පිහිටුවා ඇත. (ඉදිරියේදී මෙම අරමුදල CARP අරමුදල නමින් හැඳින්වේ.) මෙම අරමුදල සඳහා වාර්ෂික රාජ්‍ය අයවැය ලේඛනය මඟින් මුදල් වෙන් කරන අතර මහා භාණ්ඩාගාරය විසින් එම මුදල් මෙම අරමුදලට ලබා දේ. ඊට අමතරව විවිධ දේශීය හා විදේශීය ආයතන මඟින් විවිධ ව්‍යාපෘති කිරීම සඳහාද ව්‍යාපෘති අරමුදල් මෙම අරමුදලට ලබා දෙන අතර එම මුදල්ද මෙම CARP අරමුදලටම බැර කෙරේ.

මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන මුදල් කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා යොදවා ගන්නා අතර ව්‍යාපෘති සඳහා ලැබී ඇති ව්‍යාපෘති අරමුදල් ආයතනයට පැවරී ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් යොදා ගනී.

ඉහත සඳහන් 1987 අංක 47 දරන කෘෂිකාර්මික පර්යේෂණ හා ප්‍රතිපත්ති සභා ව්‍යවස්ථාවේ 14.1 වගන්තියට අනුව කෘෂිකර්ම පර්යේෂණ හා ව්‍යවස්ථා සභාව සඳහා නිලධාරින් සහ වෙනත් සේවකයින් බඳවා ගැනීමටත්, වැටුප් හා වේතන තීරණය කිරීමටත් වැටුප් ගෙවීමටත් සභාවට බලය පැවරී ඇත. තවද 1988.11.06 වැනි දින කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් සම්මත කර ගත් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ එක් එක් සේවක කාණ්ඩය සඳහා ලබා දිය යුතු වැටුප් පරිමාණයන් සහ සේවක සුභසාධන කටයුතු ( Fringe Benefits) සම්බන්ධයෙන්ද කරුණු දක්වා ඇත. 1988 බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ දක්වා ඇති පරිදි යෝජිත අමතර ප්‍රතිලාභ (Fringe Benefits) පහත පරිදි වේ.

01. වෛද්‍යාධාර රක්ෂණ ක්‍රමයක් කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති අරමුදල් යොදා ගනිමින් ආරම්භ කිරීම.
02. සේවකයින් සඳහා ණය මුදල් ලබා දීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම.
03. සේවකයින් සහ පවුලේ සමාජිකයින්ට වසරකට නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල 03 ක් ලබා දීම.
04. නොමිලේ ලබා දෙන දුම්රිය මාසික වාර ප්‍රවේශ පත්‍රයක් ( සීසන් ටිකට්පතක්) ලබා දීම.

කෙසේ නමුත් ඉහත (1) හි සඳහන් වෛද්‍යාධාර රක්ෂණ ක්‍රමයට වෙනස් වූ වෛද්‍යාධාර ක්‍රමයක් මෙම අරමුදල මඟින් අමතර ප්‍රතිලාභ හෙවත් Fringe Benefits ලෙස සේවකයින් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් වෙනුවෙන් ක්‍රියාත්මක කර ඇත.

පහත සඳහන් එම දීමනා ක්‍රමය 1988 බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටියේ සඳහන් වෛද්‍යාධාර රක්ෂණ ක්‍රමයට වෙනස් වූ වෛද්‍යාධාර ක්‍රමයකි.

01. වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම. (වර්ෂයකට රු.30000/- ක උපරිමයකට යටත්ව)
02. සේවකයින්ට හිමි වෛද්‍ය නිවාඩු 21කින් ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා දින 20 ක උපරිමයකට යටත්ව ගෙවීම් කිරීම. (මින් ඉදිරියට මෙම ප්‍රතිලාභ ගෙවීම් Fringe Benefits යන්න අමතර ප්‍රතිලාභ නමින් හඳුන්වනු ලැබේ).

නමුත් 1987 අංක 47 දරන කෘෂිකාර්මික පර්යේෂණ හා ප්‍රතිපත්ති සභා පනතේ 14.1 වගන්තියෙන් ලබා දී ඇති බලතල ප්‍රකාරව මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම සඳහා පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මඟින් අනුමැතිය ලබා දී ඇති බව පළමු පාර්ශ්වය කියා සිටී.

01. 1993.03.24 දිනැති 16/93 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව.
02. 1993.06.08 දිනැති 19/93 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව.

ඊට ප්‍රතිචාර දක්වමින් දෙවන පාර්ශ්වය කියා සිටින්නේ පළමු පාර්ශ්වය විසින් සඳහන් කරන ලද 16/93 හා 19/93 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂක මණ්ඩලය ගන්නා ලද තීරණ ඉදිරිපත් කිරීමට දෙවන පාර්ශ්වය අපොහොසත් වී ඇති බවයි. ඒ අනුව පළමු පාර්ශ්වය කියා සිටින පරිදි 16/93 හා 19/93 අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මඟින් ඉහත අමතර ප්‍රතිලාභ ගෙවීමට අනුමැතිය ලබා දුන් බවට කරන ප්‍රකාශය තහවුරු වී නැත.

නමුත් ඒ බව තහවුරු කිරීමට පළමු පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ආචාර්ය කේ.ජී. අයි. අමරසිංහ මහතා විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් වෙත යවා ඇති ලිපිය ප්‍රමාණවත් බව පැහැදිලි වේ. එම ලිපියේ 4 වන ඡේදයේ සඳහන් වන්නේ මෙම වෛද්‍ය යෝජනා ක්‍රමය හෙවත් අමතර ප්‍රතිලාභ දීමනා ක්‍රමය 1991.05.01 දින සිට ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී ඇති බවකි. තවද මෙම වෛද්‍ය යෝජනා ක්‍රමය පිළිබඳව වැඩිදුර විස්තර කිරීමක්ද මෙම අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා වලදී සිදු කර ඇත. 2003.04.25 දින පැවති 97 වන සභා වාරයේදී මෙම යෝජනා ක්‍රමයට තවදුරටත් සංශෝධන ඉදිරිපත් කර ඇති බවට පළමු පාර්ශ්වය විසින් කරනු ලබන ප්‍රකාශයට දෙවන පාර්ශ්වය විරෝධතාවයක් නොදක්වයි. මේ අනුව මෙම අමතර ප්‍රතිලාභ ගෙවීමට කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවට බලය ලැබී ඇති බව පැහැදිළිය.

1992.07.04 දින ඩේලි නිවුස් පුවත්පතේ පලකරන ලද දැන්වීමක් මඟින් කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ පවතින සේවක පුරප්පාඩු සඳහා අයදුම්පත්‍ර කැඳවීමට කටයුතු කර ඇත.මේ අනුව එම පුවත්පත් දැන්වීම මඟින් ද තෝරා ගන්නා අයදුම්කරුවන්ට මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම කරන බව ප්‍රකාශ කර ඇත.

මෙම පුවත්පත් දැන්වීම අනුව අයදුම්පත් කැඳවා බඳවා ගත් සේවකයින්ගේ පත්වීම් ලිපිවලද මෙම අමතර ප්‍රතිලාභ ලබා දෙන බවට සේවා කොන්දේසියක් ඇතුලත් කර ඇත. එම නිසා ඔවුන්ට එම අමතර ප්‍රතිලාභ සඳහා නෛතික අයිතියක් ලැබී ඇත. පළමු පාර්ශ්වය විසින් පැමිණිල්ලේ දක්වා ඇති පරිදි 1992.07.04 දින සිට 2021 වර්ෂය දක්වා මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම් කර ඇති අතර මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව විසින් වරින් වර පැහැදිලි කර ගැනීම් සඳහා කරනු ලබන ඉල්ලීම් වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් හරහා කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව වෙත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දක්වා ඇති උපදෙස් ලබා දෙමින් මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම අනුමත කර ඇත.

01. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/ACL/CARP හා 2003 02.17 දිනැති ලිපිය මගින් උපදෙස් ලබා දී ඇත්තේ 2001.01.05 දිනට පෙර බඳවා ගන්නා ලද නිලධාරින්ට පමණක් මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම පිළිබඳව විරෝධතාවයක් නොමැති බවයි.

02. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අංක DMS/E1/14/4/117 හා 2011.07.06 දිනැති ලිපිය මඟින් 2001.01.05 දිනට පෙර බඳවා ගන්නා ලද නිලධාරින්ට මෙම වරප්‍රසාදය ගෙවීම සඳහා නිර්දේශ කර ඇත.

03. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අංක DMS/1580/v-iv හා 2019.12.12 දිනැති ලිපිය මඟින් මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බව දක්වා ඇත.

2020 වර්ෂයේ පමණ සිට රටේ පැවති ආර්ථික අවපාතය හේතු කර ගෙන ඊට මුහුණ දීම සඳහා රජය විසින් විවිධ ක්‍රියාමාර්ග ගැනීමට පෙළඹී ඇත. කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සහා ආයතනයේ 2001.01.05 දිනට පෙර බඳවා ගත් සේවකයින් වෙනුවෙන් මෙතෙක් ගෙවමින් තිබූ ඉහත සඳහන් අමතර ප්‍රතිලාභ ගෙවීම 2021 වර්ෂයේ සිට කිසිදු හේතු දැක්වීමෙන් තොරව අත්හිටුවීමට පියවර ගෙන ඇත.

ඒ අනුව 2021 වසරේ සිට ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා ගෙවීම නතර කර ඇති අතර 2022 වසරේ සිට වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම නතර කර ඇත.

සේවකයින් විසින් ආයතනයේ පරිපාලනයෙන් මේ පිළිබඳව විමසීම් කර ඇති අතර සාධාරණ හේතු දැක්වීමක් කිරීමට ආයතනයේ පරිපාලනය අසමත් වී ඇත. ඒ අනුව මෙම නඩුවේ පැමිණිලිකරුවන් විසින් 2022.11.10 වැනි දින කම්කරු දෙපාර්තමේන්තුවට මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇත. එම පැමිණිල්ල විභාග කර කම්කරු කොමසාරිස් ජනරාල්ගේ අංක IR/COM/01/2023/101 හා 2023.08.15 දිනැති ලිපිය මඟින් දන්වා ඇත්තේ මෙම අමතර ප්‍රතිලාභ සේවකයින්ට ගෙවිය යුතු බවට සේවා කොන්දේසියක් සේවකයින්ගේ පත්වීම් ලිපි වල සඳහන් වන බවට කරුණු අනාවරණය වී ඇති බැවින් ද එම ගෙවීම් කිරීමට කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇති බවට කරුණු අනාවරණය වී ඇති බැවින් ද එම අමතර ප්‍රතිලාභ ගෙවීම දින 14 ක් ඇතුලත සිදු කිරීමට පියවර ගන්නා ලෙසයි.

කම්කරු කොමසාරිස් ජනරාල්ගේ නියමය ක්‍රියාත්මක කිරීමට කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව අපොහොසත්වීම නිසා ගරු කම්කරු අමාත්‍යවරයා විසින් මෙම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2024.12.09 වැනි දින මා වෙත යොමු කර ඇත. ඒ අනුව බේරුම්කරණ ක්‍රියාවලිය 2025.01.15 දින සිට ආරම්භ කරන ලදී. පැමිණිලිකාර පාර්ශ්වය විසින් තර්ක කරනුයේ කම්කරු කොමසාරිස්වරයාගේ 2023.08.15 වැනි දිනැති නියමය අනුව තමන්ට මෙම අමතර ප්‍රතිලාභ ලබා ගැනීමට හිමිකම් ඇති බවකි.

නමුත් සාක්ෂි විභාගයේදී අනාවරණය වුයේ කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව විසින් මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම නතර කිරීමට හේතු වී ඇත්තේ 2021.08.28 දිනැති අංක MF/NB/07/CM/2021/165 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව 2021.09.07 දිනැති අංක අමප/21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මෙම දීමනා අත්හිටුවීමයි ඒ අනුව මෙම අමතර ප්‍රතිලාභ ගෙවිය යුතු බවට පත් වීම් ලිපියේ සේවා කොන්දේසියක් තිබුනද එම පත්වීම් ලිපියේම ඇති වෙනත් සේවා කොන්දේසියකින් කියවෙන්නේ කලින් කල රජය සහ කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව විසින් නිකුත් කරන ලද රෙගුලාසි, නියෝගවලට ඉහත සේවා කොන්දේසි යටත් විය යුතු බවයි. ඒ අනුව මෙම අමතර ප්‍රතිලාභ ලැබීමට ඇති අයිතිය සම්බන්ධයෙන් වූ කොන්දේසිය ඉහත දක්වා ඇති පරිදි වූ රජයේ නියෝගයක් හේතුවෙන් බල රහිත වනු ඇත. එනම් ඉහත දැක් වූ 2021.09.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/21/1596/304/134 හේතුවෙන් පත්වීම් ලිපියේ දක්වා ඇති අමතර ප්‍රතිලාභ ලැබීමේ අයිතිය සම්බන්ධයෙන් වූ සේවා කොන්දේසිය බල රහිත වී ඇත.

එම නිසා 2003.08.15 දිනැති කම්කරු කොමසාරිස්වරයාගේ නියමය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවට කාෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව විසින් කියා සිටීම පිළිගැනීමට සිදු වනු ඇත.

එම අමාත්‍ය මණ්ඩල තීරණවලට ඇතුලත්ව ඇති පහත සඳහන් නිර්දේශ 2 කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කිරීම වැදගත් වේ.

01. <u>අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොමැති</u> කිසිදු දීමනාවක්, සුභසාධන වැඩසටහනක්, සංවර්ධන සහයන් හෝ සහනාධාර ලබාදීම නතර කිරීම.

02. සේවා අවශ්‍යතාවය මත අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානින්ගේ අනුමැතීන් යටතේ ගෙවනු ලබන වැටුප් නොවන දීමනා, බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම යනාදිය සමාලෝචනය කර පොදුවේ සියලු නිලධාරී කණ්ඩායම් වෙත ලබාදීම වෙනුවට සත්‍ය වශයෙන් කාර්යයේ නියැලෙන නිලධාරින්ට පමණක් සීමා කිරීම.

ඒ අනුව කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ සේවකයින් වෙත ලබා දී තිබූ මෙම අමතර ප්‍රතිලාභ ලබා ගැනිමේ හිමිකම ඉහත 1 නිර්දේශය අනුව මෙතෙක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර නොතිබීම හේතුවෙන් තවදුරටත් ගෙවීම් කිරීමට ඉඩක් නොමැති බව දෙවන පාර්ශ්වය විසින් පෙන්වා දෙයි.

මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබා තිබූ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කිරීමට පළමු පාර්ශ්වය අසමත් වී ඇති බැවින් ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අමතර ප්‍රතිලාභ මීට අදාළ සේවකයින්ට ගෙවීමට කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවට නියම කිරීමට හැකියාවක් ඇති බවක් නොපෙනේ.

කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව විසින් රජයේ වගකිව යුතු ආයතන වෙතින් උපදෙස් ඉල්ලා මෙම මතු වී ඇති තත්වය නිරවුල් කර ගැනීමට උත්සාහ දරා ඇත. ඊට ප්‍රතිචාර දක්වමින් පහත සඳහන් පිළිතුරු කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් හරහා කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව වෙත ලබා දී ඇත.

01. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අංක DMS/1580/v- iv හා 2022.03.18 දිනැති ලිපිය අනුව කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව, භාණ්ඩාගාර ප්‍රතිපාදන මත යැපෙන ආයතනයක් බැවින් "රාජ්‍ය වියදම් සමාලෝචනය" යන මැයෙන් යුතුව ඉදිරිපත් කරන ලද අංක අමප/21/1596/304/134 හා 2021.09.07 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෙම දීමනා ගෙවීමට ඉඩ කඩක් නොමැති බව දන්වා ඇත.

02. කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ සභාපතිගේ 2022/12/20 දිනැති ලිපියට පිළිතුරු වශයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් අමතා ඇති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අංක:DMS/1580/ v - iv හා 2023.04.21 දිනැති ලිපිය අනුව

I. අමප/21/1596/304/134 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ සේවකයන් සඳහා අමතර ප්‍රතිලාභ (Fringe Benefits) ගෙවිය නොහැකි බව දක්වා ඇත.

II. කෙසේ වුවද 2022.12.21 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක 8/2022 හි කොන්දේසි අනුව ඉතිරි කර ගත් නිවාඩු සඳහා ගෙවීම් කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

2022.12.21 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 08/2022 හි දක්වා ඇති පහත සඳහන් කොන්දේසිවලට යටත්ව සේවකයින් සඳහා ඉතිරි කර ගත් නිවාඩු වෙනුවෙන් ගෙවීම් කිරීමට හැකියාව ලැබේ.

(*a*) එකී රාජ්‍ය ව්‍යාපාරයේ සේවකයින්ට හිමි නිවාඩු ගණනය කිරීමේදී 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

(*b*) එකී රාජ්‍ය ව්‍යාපාරය ප්‍රාග්ධන හා / හෝ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් නොගත යුතුය.

(*c*) ගෙවීම් සඳහා සලකා බලන වර්ෂයට පෙර වසරට අදාළව මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ලාභාංශ /අය බදු ගෙවා තිබිය යුතුය.

මෙම කොන්දේසි 3ම කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව විසින් සපුරා නැත. එම නිසා මෙම චක්‍ර ලේඛය (08/2022) අනුව සේවකයින්ට ඉතිරි කර ගත් නිවාඩු සඳහා ගෙවීම් කිරීමට කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවට නොහැකිය.

03. කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිගේ අංක Agri/5/18/CARP -24 දරන 2024.09.02 දිනැති ලිපිය මඟින් මෙම ගෙවීම් කිරීම පිළිබඳව භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තු වලින් එවා ඇති ලිපි වලින් මෙම අමතර ප්‍රතිලාභ ගෙවීමට අනුමැතියක් ලබා දී නොමැති බැවින්ද 2021 සිට මෙම ගෙවීම් කර නොමැති බැවින් ද මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම් කිරීමට ඉඩ ප්‍රස්ථාවක් නොමැති බව දන්වා ඇත.

නිගමන:

01. ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවට අරමුදල් ලැබෙන්නේ මහා භාණ්ඩාගාරයෙන් පමණි.

02. කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ සේවකයන් සඳහා අමතර ප්‍රතිලාභ ගෙවීම 1991.05.01 දින සිට ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත.

03. 1992.07.04 දින සිට අමතර ප්‍රතිලාභ ගෙවීම් කිරීම සඳහා කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව විසින් පියවර ගෙන ඇත.

04. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2003.02.17, 2011.07.06, 2019.12.12 යන අවස්ථා 3දීම කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් මගින් කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවට උපදෙස් ලබා දි ඇත්තේ 2001.01.05 දිනට පෙර බඳවා ගත් සේවකයින්ට මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති බවයි.

05. ඒ අනුව මෙම අමතර ප්‍රතිලාභ ගෙවීම 1991.05.01 දින සිට 2021 වර්ෂය දක්වා ක්‍රියාත්මක වී ඇත.

06. මෙම අමතර ප්‍රතිලාභ ලැබීමට හිමිකම ඇති සේවකයින්ගේ පත්වීම ලිපිවල සේවා කොන්දේසියක් ලෙස අමතර ප්‍රතිලාභ දීමනා ලබා දෙන බවට ලිඛිතව දක්වා ඇත. තවද එම පත්වීම් ලිපිවලම තවත් කොන්දේසියක දක්වා ඇත්තේ කලින් කලට රජය සහ කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව විසින් නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලට එම කොන්දේසි යටත් විය යුතු බවයි.

07. ඒ අනුව අංක: අමප/21/1296/304/134 හා 2021.09.07 වැනි දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ වලට අනුව සහ මහා භාණ්ඩාගාරයේ විවිධ දෙපාර්තමේන්තු විසින් කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව වෙත ලබා දී ඇති උපදෙස් පරිදි අමතර ප්‍රතිලාභ දීමනා තවදුරටත් ගෙවිය නොහැක. අමාත්‍ය මණ්ඩල තීරණ මගින් සේවකයින්ගේ පත්වීම් ලිපිවල මෙම අමතර ප්‍රතිලාභ ගෙවන බවට දක්වා ඇති කොන්දේසිය අක්‍රිය වී ඇත. එසේ අක්‍රිය වීමට හේතුව එම පත්වීම් ලිපියේම තවත් කොන්දේසියක් මගින් දක්වා ඇති රජය විසින් සහ කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව විසින් කලින් කලට සාදනු ලබන රෙගුලාසි, නියෝග වලට එම සේවා කොන්දේසිය යටත් විය යුතු බව දක්වා තිබීමයි. එම නිසා ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අමතර ප්‍රතිලාභ (Fringe Benefits) ගෙවන බවට වූ සේවා කොන්දේසිය අක්‍රිය වී ඇත.

08. ඒ හැර 2022.12.21 වෙනි දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛ අංක PED/8/2022 මගින් මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදන වලින් ආයතනයේ ප්‍රාග්ධන හා / හෝ පුනරාවර්තන වියදම් දරන්නේ නම් සේවකයින්ට ඉතිරි කර ගත් නිවාඩු වෙනුවෙන් ගෙවීම් කළ නොහැකි බව දක්වා ඇත. ඒ අනුව සේවකයින්ට ඉතිරි කර ගත් නිවාඩු වෙනුවෙන් ගෙවීම් කළ නොහැක.

09. මේ අනුව කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවේ අමතර ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබා තිබූ සේවකයින්ට 2021 සිට එම දීමනා ලබා ගැනීමට අවකාශයක් නැත.

## ප්‍රදානය

කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාවට තම ආයතනයේ 2001.01.05 දිනට පෙර බඳවා ගත් සේවකයින් වෙනුවෙන් 2021 වසරේ සිට ලබා නොගත් වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීමටත් සේවකයින් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ගේ වෛද්‍ය බිල්පත් ප්‍රතිපූර්ණය කිරීමටත් අංක: අමප/21/1596/304/134 හා 2021.09.07 දිනැති කැබිනට් තීරණයට අනුව නොහැකි වී ඇත. එබැවින් කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති සභාව පහත නම් සඳහන් පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදු කර නැත.

01. ආචාර්ය එස්. එම්. පී. සී. පද්මිණි මිය
02. ආචාර්ය පී.සී.ගිරිහාගම මයා
03. එන්. බී.එස් දර්ශනී මිය.
04. හේමන්තා බටගොඩ මිය.
05. කෞමලී දිසානායක මිය.
06. නිලන්ත වීරක්කොඩි මයා

මෙය ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට තීරණය කරමි.

**එම්.එම්.අයි. ආර්. ජයතිලක,**
බේරුම්කරු.

2025 ඔක්තෝබර් මස 01 වැනි දින.

EOG 12 - 0076

මගේ අංකය: IR/COM/03/2023/107.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.09 දිනැති හා අංක 2396/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2024.08.02 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් යක්කල, කෙසෙල්වතුගොඩ, අංක 85/1 ලිපිනයෙහි පදිංචි ජී.ඩී.ජේ.සමාධි අමරතුංග මහතා සහ මොරටුව, සරික්කමුල්ල, ගාලු පාර, අංක 159 ලිපිනයෙහි පිහිටි ලංකා ටයර් රිට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A/41/2024 හා 2025.09.05 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 දෙසැම්බර් මස 02 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.

නඩු අංකය - A/41/2024
යොමු අංකය - IR/COM/03/2023/107.

ජී.ඩී.ජේ.සමාධි අමරතුංග මයා,
අංක 85/1,
කෙසෙල්වතුගොඩ,
යක්කල

*පළමු පාර්ශ්වය*

*සහ*

ලංකා ටයර් රිට්‍රේඩස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 159, ගාලු පාර,
සරික්කමුල්ල, මොරටුව

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරාවුල සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ.

ලංකා ටයර් රිට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සේවය කරනු ලැබූ ජී.ඩී.ජේ.සමාධි අමරතුංග මහතා විසින් සඳහන් කර ඇති පරිදි 2018.09.01 දින සිට 2019.12.13 දින දක්වා කාල සීමාව සඳහා ගෙවා නොමැති අතිරේක දීමනාව සඳහා ඔහුට හිමිකමක් තිබේද? යන්නත් එසේ හිමිකමක් තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද? යන්නත් පිළිබඳව වේ.

<u>පෙනී සිටීම</u>

පළමු පාර්ශ්වය වෙනුවෙන්
ඉල්ලුම්කරු හා ඔහුගේ නියෝජිත එම්.කේ. හේමපාල මහතා
දෙවන පාර්ශ්වය වෙනුවෙන්
ලංකා ටයර් රීට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සුරේන් පීරිස් මහතා
නීතිඥ මහේෂ් බේරුගොඩ මහතා

**බේරුම්කරණ පරිපාටිය**

මෙම බේරුම්කරණය 2024.09.11, 2024.10.09, 2024.10.30, 2024.12.10, 2024.01.15, 2025.02.18, 2025.03.26, 2025.04.24, 2025.06.18, හා 2025.07.29 යන දිනයන්හි විභාග කරන ලදී.

මෙම කාර්මික ආරාවුල බේරුම්කරණය වෙත ඉදිරිපත් කරමින් පලමු පාර්ශ්වය කියා සිටිනුයේ

A. ඉල්ලුම්කාර සමාධි අමරතුංග මහතා 2018.03.19 දින සිට 2019.12.13 දක්වා වගඋත්තරකාර (ලංකා ටයර් රීට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්) සමාගම යටතේ සේවය කරමින් සිටියදී සාධාරණ කරුණකින් හෝ පූර්ව දැනුම්දීමකින් තොරව සේවයෙන් පහ කිරීම ඇතුළු කරුණු කිහිපයක් සම්බන්ධයෙන් පානදුර දිස්ත්‍රික් කම්කරු කාර්යාලය වෙත පැමිණිලි කිරීමෙන් අනතුරුව,

පළමු පාර්ශ්වය වන සමාධි අමරතුංග මහතාට

01. නොගෙවූ දින 13 ක වැටුප ද

02. පැහැර හැර තිබූ සේවක අර්ථසාධක අරමුදල වෙත බැර කළ යුතුව තිබූ මාස 06 ක දායක මුදල් ද, පානදුර ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ පැමිණිලි අංක 82638 දරන නඩුවේ නියෝගය මත සමාධි අමරතුංග නැමැති පැමිණිලිකරු වෙත, වගඋත්තරකාර ආයතනය විසින් ගෙවන ලද බවද

B. කම්කරු දෙපාර්තමේන්තුවේ සේවය අවසන් කිරීමේ අංශය වෙත ඉදිරිපත් කරන ලද පැමිණිලි විභාග කිරීමෙන් අනතුරුව ආයතනයේ සේවයෙන් පහ කිරීම හේතුවෙන් රු 100,000.00(රු. ලක්ෂයක) ක වන්දි මුදලක් ද පළමු පාර්ශ්වය වන සමාධි අමරතුංග මහතා වෙත ලබාදීමට දෙවන පාර්ශ්වය වන ලංකා ටයර් රීට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට සිදු වූ බව පළමු පාර්ශ්වය විසින් බේරුම්කරණය වෙත සැලකර සිටින ලදී.

ඉන් අනතුරුව, දෙවන පාර්ශ්වය වන ලංකා රීට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් පළමු පාර්ශ්වය වන සමාධි අමරතුංග මහතා වෙත ඔහුට අදාළ මාසික වැටුප් සමග ගෙවීමට ගිවිසුම් ගතවී ඇති රු.75000.00 (හැත්තෑ පන් දහසක) ක අතිරේක දීමනාව නොගෙවීම සම්බන්ධයෙන් නාරාහේන්පිට කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සබඳතා අංශයේ පැවති පරීක්ෂණයෙන් පසුව එකී දීමනාව ලබා ගැනීමේ කුසලතා ඇති බවට නිගමනය කොට කම්කරු කොමසාරිස් ජනරාල්ගේ නිර්දේශය පරිදි කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය පරිදි ගරු කම්කරු අමාත්‍යතුමන් වෙත නීත්‍යානුකූලව පැවරී ඇති බලතල ප්‍රකාරව වැඩිදුරටත් කරුණු විභාග කොට සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් ලබාදීම පිණිස ගරු බේරුම්කරණය වෙත පැමිණිලි කර ඇති බව නිරීක්ෂණය කරමි.

**C. ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වයේ කරුණු ඉදිරිපත් කිරීම**

වගඋත්තරකාර ආයතනයේ සේවයට බැඳී මාස 06 ක සේවා කාලය තුළ, පැමිණිලිකරු ප්‍රායෝගිකවම දැක් වූ හැකියාවන් හා දක්ෂතාවයන් මැන බැලීමෙන් හා ඇගයීමෙන් පසුව 2018.09.20 දින සිට සමාගම් 03 ක අලෙවි හා විකුණුම් ප්‍රවර්ධන කළමනාකාර තනතුර සඳහා ඉල්ලුම්කරුගේ සේවය ස්ථිර කිරීමට දෙවන පාර්ශ්වය විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

වැටුප හැර අනෙකුත් සේවා කොන්දේසි 2018.03.19 දිනැති මුල් පත්වීම් ලිපිය අනුව නොවෙනස්ව පවතින බවට හා, A 2 දරන ස්ථිර පත්වීම් ලිපියේ වැටුප සම්බන්ධයෙන් වූ කොන්දේසිය පමණක් පහත සඳහන් අයුරින් සංශෝධනය කොට, මාසිකව අතිරේක දීමනාවක් ද ගෙවීමට එකඟ වී ඇති බව පත්වීම් ලිපිය අනුව නිරීක්ෂණය වේ.

Your salary will be increased to Rs. 90, 000 per month with an additional allowance of Rs. 75, 000/=

ඒ අනුව ගෙවීම් කරන බවට දෙවන පාර්ශ්වයේ කළමනාකාර අධ්‍යක්ෂකතුමිය විසින්, “A2” දරන ලිපියේ ප්‍රකාරව මාසික ගෙවීම් සම්බන්ධයෙන් වූ කොන්දේසිය සංශෝධනය කොට අත්සන් කරමින් සහතික කොට තිබියදී,

විකුණුම් ප්‍රවර්ධන වියදම් ප්‍රතිපූරණය කිරීම පිණිස, පැමිණිලිකාර පාර්ශ්වය වන, සමාධි අමරතුංග මහතා නමින්, සම්පත් බැංකුවේ ගිණුමක් ගණකාධිකාරිවරයා විසින් අරඹා රු.75000.00( හැත්තෑ පන් දහසක) ක මුදලක් තැන්පත් කොට, එම ගිණුමෙන් අලෙවි කළමනාකරු ලබාගන්නා මුදලින්, එදිනෙදා දෛනික වියදම් පියවා ගන්නා අතර එකී බිල්පත් ගණකාධිකාරිවරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසුව ගණකාධිකාරිවරයා විසින් ඊට අදාළ මුදල් ප්‍රතිපූරණය කිරීමක් ලෙස බැංකුගත කිරීම සිදු කෙරෙමින් පැවති අතර, එය ඉල්ලුම්කරුට වැටුප සමග ගෙවීමට නියමිත අතිරේක දීමනාව බවට සාක්ෂි ලබාදී ඇත.

තවද “ A2 “ දරන ස්ථිර පත්වීම් ලිපියේ එවැනි රු.75000/- (හැත්තෑ පන් දහසක) ක ප්‍රතිපූර්ණ දීමනාවක් පිළිබඳව සඳහන් කර නොතිබියදි,

ඉල්ලුම්කරුට සිය වැටුප සමග මාසිකව ගෙවනු ලැබීමට කළමනාකාර අධ්‍යක්ෂතුමිය විසින් අදාළ සේවා ගිවිසුමේ කොන්දේසියක් මගින් සහතික වී ඇති රු.75000/- (හැත්තෑ පන් දහසක) ක අතිරේක දීමනාව ගණකාධිකාරිවරයා විසින් අත්තනොමතිකව, හිතාමතාම නොගෙවා පැහැර හැරීම මගින් වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් ම මෙම කාර්මික ආරාවුල නිර්මාණය කර ඇති අතර එමගින් දෙවන පාර්ශ්වය විසින් ඉල්ලුම්කරුට බරපතල මූල්‍යමය අලාභයක් සිදු කර ඇති බව පළමු පාර්ශ්වයේ ස්ථාවරය වේ.

**D. වගඋත්තරකාර දෙවන පාර්ශ්වයේ කරුණු ඉදිරිපත් කිරීම**

2019.10.01 දින සිට කෙසෙල්වත්ත සම්පත් බැංකුවේ විවෘත කරන ලද අංක 115157729718 දරන ගිණුමේ තැන්පත් කරන ලද විකුණුම් ප්‍රවර්ධන මුදල රු.75000/- (හැත්තෑ පන් දහසක ) ක මුදල ඉල්ලුම්කාර පී.ඩී.ජේ.එස්.අමරතුංග මහතාට ගෙවීමට නියමිතව තිබූ අතිරේක දීමනාව බවත් ආයතනය එය අර්ථ කථනය කරන්නේ එලෙස බවත් X4 සිට X14 දක්වා සලකුණු කළ ලේඛන මගින් (i) 2018.11.01 දින රු.10960/- ක්ද (ii) 2018.11.20 දින රු.30311/- ක්ද (iii) 2018.12.31 දින රු. 49168.50 ක් ද (iv) 2019.02.01 දින රු. 50000/- ක් ද (v) 2019.02.05 දින රු. 2797/- ක් ද (vi) 2019.03.08 දින රු. 40023/- ක් ද (vii) 2019.04.01 දින රු. 47598/- (viii) 2019.05.02 දින රු. 23350/- ක් ද (ix) 2019.06.15 දින රු. 16446/- ක් ද (x) 2019.07.05 දින රු. 18222 /- ක් ද (xi) 2019.09.03 දින රු .28132/- ක් ද, වශයෙන් ප්‍රතිපූරණය කර ඇත්තේ එකී මුදල බවත් ඒ අනුව පළමු පාර්ශ්වකරුට ගෙවිය යුතු කිසිදු හිඟ මුදලක් නොමැති බවත් වගඋත්තරකාර දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වේ.{ එකී මුදල්වල අංක ගණිතමය එකතුව රු.317,007.50 කි (රුපියල් තුන් ලක්ෂ දාහත් දහස් හතයි ශත පනහක්) }

**E. බේරුම්කරණයේ නිරීක්ෂණ**

E - 1. ඉහත වගඋත්තරකාර පාර්ශ්වය විසින් 2018.11.01 දින සහ 2019.09.03 දින දක්වා අඛණ්ඩව දින 11 ක් තුළ ගෙවන ලද ප්‍රතිපූරණය කරන ලද මුදල් ප්‍රමාණවල එකතුව රු .317,007.50 /- කි. ( රුපියල් තුන් ලක්ෂ දාහත් දහස් හතයි ශත පනහක)

E - 2. පැමිණිලිකරු ප්‍රකාශ කරන අන්දමට ඔහුට එම කාලය සඳහා එනම් 2018.09.20 දින සිට ඔහුගේ සේවය අවසන් වී ඇති 2019 සැප්තැම්බර් මස 19 දක්වා මාස 12 ක් සඳහා ( රු 75,000* මාස 12) රු. 900,000.00 ( රුපියල් නව ලක්ෂයක) මුදලක් ගෙවිය යුතු වේ.

E - 3. එසේ හෙයින්, සමාධි අමරතුංග මහතා වෙත දැනට ගෙවා ඇති මුදල වන රු.317,007.50 ක් අඩු කල විට (රු.900,000.00 -රු. 317,007.50 ) රු.582,992.50 (පන් ලක්ෂ අසූ දෙදහස් නවසීය අනූ දෙකයි ශත පනහක) ක මුදලක් පැමිණිලිකරු වෙත දෙවන වගඋත්තරකාර ආයතනය විසින් ගෙවිය යුතු බව සාමාන්‍ය ව්‍යවහාරික ගණනය කිරීම් අනුව නිශ්චය කළ හැක.

ඒ අතර පැමිණිලිකරු විසින් ඉල්ලුම් කරනු ලබන වගඋත්තරකාර ආයතනයේ කළමනාකාර අධ්‍යක්ෂකවරිය විසින් සමාධි අමරතුංග මහතා (පැමිණිලිකාර පාර්ශ්වයට) ගෙවන බවට දක්වා ඇති අතිරේක දීමනාව ගැන ආයතනයේ ගණකාධිකාරිවරයා විසින් Merriam Webster Dictionary යේ ඉංග්‍රීසි ශබ්ද කෝෂයේ නිර්වචනයෙන් ගෙනහැර දක්වමින්, එය ප්‍රතිපූර්ණය කරනු ලබන දීමනාවක් බවට කරුණු ඉදිරිපත් කරන ලදී.

මෙම නිර්වචනය පිළිබඳව සලකා බැලීමේ දී, Oxford English Dictionary (OED) (ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්ද කෝෂය) අනුව අතිරේක දීමනාවක් යනු (Additional Allowance)

"An amount of money that is given to someone regularly or for a specific purpose"
"Reimbursement" යන්න
"Means the act of compensating someone " ලෙස නිර්වචනය වේ.

E - 4. මෙහිදී අතිරේක දීමනාව හා ප්‍රතිපූරණය කරනු ලබන දීමනාව පිළිබඳ ලොව පිළිගත් ඉංග්‍රීසි ශබ්දකෝෂ වල නිර්වචන පහත පරිදි වේ.

මෙම කාරණය සම්බන්ධයෙන් ආයතනයක් විසින් එහි සේවා නියුක්ත පුද්ගලයෙකුට ගෙවනු ලබන අතිරේක දීමනාව (Additional Allowance) හා ප්‍රතිපූර්ණය කරන දීමනාව (Reimbursement Allowance) පිළිබඳව ලොව පිළිගත් ඉංග්‍රීසි ශබ්ද කෝෂ වල නිර්වචන පිළිබඳව බේරුම්කරණයේ අවධානය යොමු කරන ලදි.

ඒ අනුව Oxford English Dictionary හි අර්ථ දැක්වීම අනුව Additional Allowance යන්න An amount of money that is giving to someone for a specific purpose ලෙස දැක්වේ.

ඒ අතර Reimbursement (ප්‍රතිපූරණය කිරීම්) යන්න Act of Compensating someone ලෙස ද දැක්වේ.

E - 5. එමෙන්ම අතිරේක දීමනාව (Additional Allowance) හා ප්‍රතිපූරණය කරනු ලබන දීමනාව පිළිබඳව ලොව පිළිගත් ශබ්ද කෝෂවල නිර්වචන පිළිබඳව ද මෙම බේරුම්කරණයේ විශේෂ අවධානය යොමු කරන ලදී. ඒ අනුව,

Oxford English Dictionary අනුව

"An amount of money that is given to someone regularly or for a specific purpose."

"A monetary benefit given to an employee on top of their basic salary typically to cover certain expenses like housing travel Or other costs incurred by the employee due to their job"

Merriam Webster English Dictionary අනුව

Additional Allowance refers to an extra sum of money given a benefit, Often to cover specific expenses or as a bonus for example a company might given an allowance to travel costs or a holiday allowance fund their time off.

It is a payment modeled in addition to a basic salary

- To compensate employees for cost like transport (Mileage allowance purchasing allowance of money paid to an employee in addition to their basic salary to help cover specific work related expenses such an travel, housing or food

- Merriam Webster dictionary does not define the return itself but definitions in other dictionary describes the allowance an a payments from a company to employee to help their cost with costs like food, transport or other expenses related to their job.

- එහෙත් එකී ඉංග්‍රීසි ශබ්ද කෝෂ දෙකෙහිම එම අතිරේක මාසික දීමනාව, වියදම් ප්‍රතිපූරණය කිරීමේ දීමනාවක් ලෙස නිර්වචනය කර නොමැත.

F. බේරුම්කරණ පරීක්ෂණයේදී තහවුරු වූ කරුණු සහ සිද්ධි

පළමු පාර්ශ්වය වෙත නිකුත් කරන ලද ස්ථිර පත්වීම් ලිපිය

ප්‍ර: සේවා ගිවිසුම අනුව වැටුප යන කොන්දේසිය යටතේ ගිවිසගත් වැටුප හා අතිරේක දීමනාව කැමතිද?

පිළිතුර: ඉල්ලුම්කරු රු 165000/- (රුපියල් එක් ලක්ෂ හැට පන් දහසක්) ක් මූලික වැටුප ලෙස ඉල්ලා සිටිය බව සහ සේවක අර්ථසාධක අරමුදල (EPF ) ට ගෙවීමට සිදුවන බැවින් වැටුප රු. 90000/- (රුපියල් අනූදහසක් ) ක් ලෙසත් රු 75000/-(හැත්තෑ පන් දහසක් ) ක දීමනාවක් ආයතනයෙන් ගෙවන්න පොරොන්දු වූ බවත් හරස් ප්‍රශ්න වලදී පැහැදිලි විය.

එහෙත් එහිදී වැටුපට අමතරව ගෙවීමට ගිවිසගෙන ඇති අතිරේක දීමනාව රු 75000/- (හැත්තෑ පන් දහසක් ) ක වැටුප සමග ගෙවනවාද? වියදම් ප්‍රතිග්‍රහණය කිරීම මගින් යන්න ගැන ආයතනය විසින් විශේෂිතව පත්වීම් ලිපියේ සඳහන් කර නොමැත

G. එසේ හෙයින් මෙහිදී පැමිණිලිකරු වෙත වගඋත්තර ආයතනයේ පත්වීම් බලධරයා විසින් නිකුත් කරන ලද සේවය ස්ථිර කිරීමේ ලිපියේ " Your salary will be increased to Rs 90000/-month with an additional allowance of Rs. 75000/- සඳහන් වන අන්දමට එම අතිරේක දීමනාව ගෙවන ආකාරය ගැන විශේෂයෙන් සඳහනක් කර නොමැත. එය වග උත්තරකරුගේ පැත්තෙන් බලන විට අඩුපාඩුවක් ලෙස පෙනියයි.

තවද පැමිණිලිකරු එම සේවා කාලය තුළ වියදම් ප්‍රතිපූරණය කරන ලද අවස්ථාවන් වලදී හෝ ඔහු වෙත ඔහුව පත්වීමේ ස්ථිර කිරීමේ ලිපිය නිකුත් කරන අවස්ථාවේදී මාසික වැටුප ගැන සාකච්ඡා කරන අවස්ථාවේදි අර්ථසාධක අරමුදලට දායකත්වය වැනි ගෙවීම් අඩුකර ගැනීමේ අරමුණින් ඔහුගේ වැටුප රු.90000/- (රුපියල් අනූ දහසක් ) ක් හා රු .75000/-(හැත්තෑ පන් දහසක් )ක අතිරේක දීමනාවක් ලෙස කොටසක් ගෙවීමට එකඟ වූ බව පවසයි.

එහෙත් ඔහු විසින් එකී අතිරේක දීමනාව ප්‍රතිපූරණය කිරීමේදී ඒ පිළිබඳව විමසීමක් හෝ විරුද්ධත්වය ප්‍රකාශ කිරීමක් සිදුකර නොමැත. එබැවින් දෙපාර්ශ්වයේම එම අතිරේක දීමනාව නිර්වචනය කිරීමේදී හා දෝෂ ක්‍රියාත්මක කිරීමේදි පැමිණිලිකරුගේ සක්‍රිය සේවා කාලය සඳහා රු 75000/-ක (හැත්තෑ පන් දහසක්) දීමනාව ගෙවිය යුතු බවට නිගමනය කරමි.

තවද එම කාලය තුළ පැමිණිලිකරු වෙත ප්‍රතිපූරණය කරමින් ගෙවා ඇති මුදල් ප්‍රමාණය ඉන් අඩුකර ඉතිරි මුදල් ගෙවිය යුතු බවට ද නිගමනය කරමි. මෙහිදී මෙම වගඋත්තරකාර ආයතනය විසින් පැමිණිලිකරුට අදාළ EPF මුදල් මාස 06 ක කාල සීමාවක් සඳහා අදාළ ගිණුම්වලට බැරකර නොතිබූ බැවින් එය කම්කරු දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත ගරු මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 82638 නියෝගයක් මත ගෙවන ලද බවද නිරීක්ෂණය කරමි. එබැවින් වගඋත්තරකාර සමාගම ද සිය සේවකයින් ට අදාළ ගෙවීම් නිසි පරිදි විධිමත්ව ගෙවීම් කිරීම පිළිබඳව යහපත් පරිචයක් නොතිබූ බවද තහවුරු වේ.

තවද වග උත්තර කාර ආයතනයේ හිමිකාරිත්වය එනම් කළමනාකාර අධ්‍යක්ෂකවරිය ලිඛිතව පැමිණිලිකරුවන් පත්වීම් ස්ථිර කිරීමේ ලිපියේ සඳහන් කරන ලද දීමනාව සාවද්‍ය ලෙස අර්ථ නිරූපණය කර ඇත්තේ ආයතනයේ ගණකාධිකාරිවරයා විසිනි.

## ප්‍රදානය

එබැවින් පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීම පිළිබඳව හේතු සොයා බැලීම හා ඒ වෙනුවෙන් කටයුතු කිරීම මෙම ගරු බේරුම්කරණයේ විෂය පථයට අදාළ නොවන්නක් බැවින් බේරුම්කරණය වෙත යොමු කර ඇති අතිරේක දීමනාව පිළිබඳව පමණක් සලකා බලා මෙම ප්‍රදානය තීරණය කිරීම සාධාරණ හා යුක්ති සහගත වේ.

ඉහත විශ්ලේෂණය කරන ලද සියලු කරුණු කාරණා සලකා බැලීමෙන් අනතුරුව පහත සඳහන් ප්‍රදානය කිරීම සාධාරණ හා යුක්ති සහගත බව නිගමනය කරමි.

ලංකා ටයර් රීට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සේවය කරනු ලැබූ G.D.J. සමාධි අමරතුංග මහතා විසින් සඳහන් කර ඇති පරිදි 2018.09.01 දින සිට 2019.12.13 දක්වා කාලසීමාව සඳහා ගෙවා නොමැති අතිරේක දීමනාව සඳහා ඔහුට හිමිකමක් තිබේද යන්නෙහි පිළිතුර ඔව් යන්නත් එසේ හිමිකමක් තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නට මේ සම්බන්ධයෙන්;

01. මෙහිදී පැමිණිලිකරු වන සමාධි අමරතුංග වෙත රු.75000/- ක (හැත්තෑ පන් දහසක ) මාසික අතිරේක දීමනාව අදාළ වන්නේ ඔහුගේ පත්වීම ස්ථිර කරමින් නිකුත් කරන ලද පත්වීම් ලිපියේ සඳහන් වන අන්දමට 2018.09.20 දින සිට ඔහුගේ සේවය අවසන්

වී ඇති 2019 සැප්තැම්බර් මස 19 දක්වා මාස 12 ක් සඳහා වේ. ඒ අනුව පැමිණිලිකරුට රු .75000/- ක (හැත්තෑ පන් දහසක ) අතිරේක දීමනාව සඳහා මාස 12 ක හිමිකමක් ඇත.

02. ඒ අනුව පැමිණිලිකරුට හිමිවිය යුතු සහනයන් ලෙස රු 75000/- x මාස 12 = රු 900, 000/- ක් හිමිවිය යුතු බවත්, එහෙත් වගඋත්තරකාර ආයතනයකින් පැමිණිලිකරු වෙත දැනටමත් එනම් 2018.11.01 දින සිට 2019.09.03 දක්වා සම්පත් බැංකුවේ ගිණුම හරහා ගෙවා ඇති රු 317,007.50 ක මුදල අඩුකර (රු. 900,000.00 - රු .317007.50) රු. 532,992.50 ක ( පන් ලක්ෂ අසූ දෙදහස් නවසිය අනූ දෙකයි ශත පනහක) මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවද තීරණය කරමි.

03. වගඋත්තරකාර පාර්ශ්වය දීමනාව ගෙවීමේ ආකාරය පිළිබඳව නිශ්චිතව සඳහන් කර නොමැති වීම හා පැමිණිලිකරු විසින් ඒ පිළිබඳව එම දීමනාව ප්‍රතිපූරණය කරන අවස්ථාවලදී ඒ පිළිබඳව විමසීමක් නොකර සිටීමත්, වගඋත්තරකාර ආයතනයේ ගණකාධිකාරිවරයා විසින් වෙනස් ආකාරයකින් අර්ථ නිරූපණය කර පැමිණිලිකරුට ආයතනයේ හිමිකාරිත්වය විසින් තීරණය කරන ලද දීමනාව නොගෙවා පැහැර හැරීමක් සිදු වී ඇති බැවින්, පැමිණිලිකරුට ඉහත සඳහන් කරන ලද මාස 12 කාල සීමාවට අදාළ රු .75000/- (හැත්තෑ පන් දහසක) වන අතිරේක දීමනාව ගෙවිය යුතු බැවින් එහිදී මේ දක්වා සමාධි අමරතුංග මහතා / පැමිණිලිකරුගේ බැංකු ගිණුමට බැරකර ඇති මුදල වන රු. 317,007.50 /- (රුපියල් තුන් ලක්ෂ දාහත් දහස් හතයි ශත පනහක) මුදල අඩුකර ඉතිරි මුදල වන රු. රු.582,992.50 (පන් ලක්ෂ අසූ දෙදහස් නවසිය අනූ දෙකයි ශත පනහක) පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවට ද තීරණය කරමි.

එකී මුදල මෙම ප්‍රදානය *ගැසට්*ගත කිරීමෙන් මසක් ඇතුළත දකුණු කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතු බවට නියම කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත හා ප්‍රදානයක් බවට ද නිගමනය කරමි.

**කේ.ඒ.එස්. කීරගල,**
බේරුම්කරු.

2025 සැප්තැම්බර් මස 09 වැනි දින.

EOG 12 - 0077

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.